# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

**සමාජීය විද්‍යා පීඨය**

මනෝ විද්‍යාව - PSYC -E2025

ව්‍යවහාරික මනෝවිද්‍යාව

<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. ''විවිධ සමාජ-මානසික ගැටලු සඳහා මනෝවිද්‍යාවේ මූලධර්ම ප්‍රායෝගිකව ගැලපීම ව්‍යවහාරික මනෝවිද්‍යාවේ කාර්යභාරයයි.'' ව්‍යවහාරික මනෝවිද්‍යාවට අයත් ඔබ කැමති විෂය ක්ෂේත්‍ර දෙකක් ඇසුරෙන් ඉහත ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කරන්න.

02. පුද්ගලයා අවට ඇති භෞතික පරිසරය ඔහුගේ චර්යාව කෙරෙහි බලපාන ආකාරය මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත ඇසුරෙන් පරීක්ෂා කරන්න.

03. බුද්ධි පරීක්ෂණයන්ට අදාළව පහත දැක්වෙන සංකල්ප විස්තර කරන්න.

    අ) විවිධ බුද්ධි පරීක්ෂණ ක්‍රම
    ආ) බුද්ධි පරීක්ෂණයන්හි සීමා
    ඇ) බුද්ධි පරීක්ෂණ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විකල්ප අදහස්

04. 'උගත් අසරණකම' යන සංකල්පය පැහැදිලි කරමින් පුද්ගලයෙකු මත එය ස්ථාපිත වන ආකාරය හා එය පුද්ගල චර්යාව කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙන්න.

05. පිරිස් කළමනාකරණය සඳහා මනෝවිද්‍යාව අවශ්‍ය කරන්නේ ඇයි? පිරිස් කළමනාකරණයේ පවතින ගැටලු සහ ඒවා විසඳීමට මනෝවිද්‍යාවෙන් ලැබෙන දායකත්වය විස්තර කරන්න.

06. අධිකරණමය ක්‍රියාදාමයන් සඳහා මනෝවිද්‍යාවෙන් ලැබිය හැකි පිටිවහල කවරේදැයි උදාහරණ සමගින් විස්තර කරන්න.

07. ක්ලමථය යනු කවරේදැයි විස්තර කරමින් එය පුද්ගලයාගේ කායික, මානසික සහ සමාජ නීරෝගීත්වය කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙන්න.

අ. පි. බ.

08. උපදේශන සේවය සමාජ සංවර්ධනය කෙරෙහි දායක වන ආකාරය විස්තර කරන්න.

09. ඔබ කැමති උපදේශන ප්‍රවේශයක් තෝරාගෙන ඒ ඇසුරෙන් පුද්ගලයාගේ ස්වභාවය හා ඔහුගේ ගැටලුවලට හේතු විස්තර කරන්න.

10. අධිමනෝවිද්‍යාවට (පාරමනෝවිද්‍යාවට) අයත් පහත සංකල්ප ඇසුරු කර ගනිමින් රචනාවක් ලියන්න.

   අ) අධිමනෝවිද්‍යා පදය නිර්වචනය කිරීම

   ආ) අධිමනෝවිද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය

   ඇ) අධිමනෝවිද්‍යාවේ ඉතිහාසය හා ඒ ගැන සිදු කෙරී ඇති පරීක්ෂණ

   ඈ) මනෝවිද්‍යාවට අධිමනෝවිද්‍යාවෙන් ඇති ප්‍රයෝජන

****************************